# ශ්‍රී ලංකාවේ දේශීය සහල් මිල තීරණය වීමට බලපාන සාධක

**එච්. එම්. අයි. සඳමාලි සහ එම්. බී. රණතිලක**

*ආර්ථික විද්‍යාව හා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය*

***මූල පද:*** *දේශීය සහල් මිල, උච්චාවචනය, බලපෑම් සාධක*

## හැඳින්වීම

පොදුවේ ගත්කල සහල් ගෝලීය වශයෙන් මෙන්ම ආසියාතික වශයෙන් ද ප්‍රධාන ආහාර ද්‍රව්‍යයකි. ලෝක ජනගහනයෙන් බිලියන 2.4 ක් ම තම පෝෂණ අවශ්‍යතාව වෙනුවෙන් සහල් පරිභෝජනය කරති. සහල් තුළින් ඔවුන්ගේ දෛනික කැලරි අවශ්‍යතාවයෙන් සියයට 20 කට වඩා වැඩි ප්‍රමාණයක් සපුරාගනු ලබයි (Lampe 1995). එසේම IRRI (2013) වාර්තාවට අනුව ගෝලීය ඒක පුද්ගල ශක්ති පරිභෝජනයෙන් 1/4ක් පමණ සහල් පරිභෝජනයෙන් සපයාගත හැකි වේ. Peterson & Warren (1989) සිදුකළ අධ්‍යයනයකට අනුව ශ්‍රී ලංකාව ද ඇතුළුව සහල් මූලික ආහාරය කොටගත් ආසියාතික රටවල් 14ක් හඳුනාගෙන තිබේ. ඒ බංගලාදේශය, බුරුමය, චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, ජපානය, දකුණු කොරියාව, මැලේසියාව, නේපාලය, පිලිපීනය, සිංගප්පූරුව, ශ්‍රී ලංකාව, තායිලන්තය සහ තායිවානය යනාදිය යි. ආසියාතික රටවල් විසින් ලෝක සහල් නිෂ්පාදනයෙන් සියයට 90 ක් නිෂ්පාදනය සහ පරිභෝජනය කරනු ලබයි (ලොකුපතිරගේ 2012).

ලෝක ජනගහනය වර්ධනය වීමට සමාන්තරව හරිත විප්ලවය තුළින් නව වී වර්ග හඳුන්වාදීම සහ පොහොර තාක්ෂණය වැඩිදියුණු වීම හේතුකොට ගෙන සහල් නිෂ්පාදන අංශයේ සුවිශේෂී වර්ධනයක් දක්නට ලැබුණි (ලෝක ආහාර සහ කෘෂිකාර්මික සංවිධානය 2012). පසුගිය දශක දෙකක කාලය තුළ චීනය, මැලේසියාව හා තායිලන්තය වැනි මැදි ආදායම් ලබන රටවල මස් සහ එළවළු වැඩිපුර පරිභෝජනය කර තිබෙන අතර ධාන්‍ය වර්ග අඩුවෙන් පරිභෝජනය කර තිබේ. එසේම බංගලාදේශය, කාම්බෝජය, ලාඕසය, මියන්මාරය සහ පිලිපීනය වැනි මධ්‍යම අඩු ආදායම් ලබන ආසියාතික රටවල් බොහොමයක ඒක පුද්ගල සහල් පරිභෝජනය කාලයත් සමඟ ඉහළ යන තත්වයක් දක්නට ලැබේ. නමුත් මෑතකාලීනව ඉන්දියාව, ඉන්දුනීසියාව, වියට්නාමය හා ශ්‍රී ලංකාව වැනි අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින ආසියාතික රටවල ආදායම ඉහළයාමත් සමඟ ඒක පුද්ගල සහල් පරිභෝජනය සෙමින් පහළ බසින තත්වයක් දක්නට ලැබේ (IRRI 2013). මෙලෙස තම ආදායම ඉහළයාමත් සමඟ මිනිසුන් තම භෝජන රටාව වෙනස් කිරීමක් දක්නට ලැබෙන බැවින් ඒක පුද්ගල සහල් පරිභෝජනයේ

වෙනස්වීමක් පවතී. නමුත් අඩු ආදායම්ලාභී රටවල්වල සමස්ත සහල් ඉල්ලුමේ ඉහළයාමක් පවතී. ඒ තම ශක්ති අවශ්‍යතාවයෙන් වැඩි ප්‍රමාණයක් උකහාගැනීම සඳහා තම ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් සහල් පරිභෝජනය වෙනුවෙන් වැය කිරීමෙනි. FAPRI (2013) වාර්තාවට අනුව 2010 වර්ෂයේදී මිලියන ටොන් 388ක් වූ ආසියාතික සහල් ඉල්ලුම 2035 වසර වනවිට මිලියන ටොන් 465ක් ලෙස වර්ධනය වන බව ප්‍රක්ෂේපනය කර තිබේ. ඒක පුද්ගල ආදායම් වර්ධනය වේගවත් වීම හා ජනගහන වර්ධන වේගය ඉහළයාමත් සමඟ මෙලෙස ගෝලීය වශයෙන් පවතින සහල් ඉල්ලුම් හා සැපයුම් ප්‍රවණතාවයන් මත ලෝක සහල් මිල නිරන්තරයෙන් උච්චාවචනය වන තත්වයක් හඳුනාගත හැකිය.

ලෝක සහල් මිල අස්ථාවර ස්වභාවයෙන් පැවතීම එම රටවල සහල් නිෂ්පාදකයන්ගේ සහ අතරමැදිකරුවන්ගේ ආදායම් කෙරෙහි මෙන්ම ඉල්ලුම් කරුවන්ගේ පැහැදම කෙරෙහි ද නොයෙක් බලපෑම් සිදුකළ හැකියි. ප්‍රධාන ආහාර ද්‍රව්‍යයක් ලෙස පමණක් නොව රසකැවිලි නිෂ්පාදනය, මත්ද්‍රව්‍ය පාන වර්ග සැකසීම, සබන් සහ සේදුම් කාරකයන් නිෂ්පාදනය මෙන්ම පශු සම්පත් නිෂ්පාදනය සඳහා ද බොහෝ රටවල් සහල් ඉල්ලුම් කරති (IRRI 2013). එබැවින් සහල් මිල ඉහළයාම ගෝලීය වශයෙන් විවිධ පාර්ශවයන් කෙරෙහි බලපෑම් එල්ල කළ හැකි සාධකයකි. එනම් ඉහළයන සහල් මිල පාරිභෝගික ක්‍රයශක්තිය සහ ජීවන තත්වය කෙරෙහි බලපෑම් ඇතිකළ හැකි අතරම නිෂ්පාදන කර්මාන්තවල පිරිවැය ඉහළ ගොස් කර්මාන්ත බිඳවැටීමට මෙන්ම ජාත්‍යන්තර වශයෙන් උද්ධමනකාරී ස්වභාවයන් සහ සේවා වියුක්ති තත්වයන් පවා ඇතිකරන අර්බුධකාරී වාතාවරණයක් ද ඇතිකිරීමේ හැකියාවක් පවතියි.

ආසියාතික රටක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ ද සහල් සඳහා සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික වැදගත්කමක් පවතී. ශ්‍රී ලාංකිකයන් අතිබහුතරයක් තම ප්‍රධාන ආහාරය වශයෙන් සහල් පරිභෝජනය කරති. ඔවුන් තම කැලරි අවශ්‍යතාවයෙන් සියයට 45 ක් ද ප්‍රෝටීන් අවශ්‍යතාවයෙන් සියයට 40ක් ද සහල් පරිභෝජනයෙන් සපුරාගනු ලබයි (IRRI 2013). ඒ සඳහා එක් පුද්ගලයකු වර්ෂයකදී සහල් කිලෝග්‍රෑම් 100ක් පරිභෝජනය කරයි (ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2013). සහල් සඳහා වන ඉල්ලුම වර්ෂයකට සියයට 1.1 බැගින් ඉහළ යන බව ඇතැම් පුරෝකතන තුළින් හෙළිකරන අතර එම ඉල්ලුම සපුරාලීම සඳහා සහල් නිෂ්පාදනය වර්ෂයකට සියයට 2.9ක අනුපාතයකින් ඉහළ යා යුතුයැයි ගණන් බලා තිබේ (ශ්‍රී ලංකා මහ බැංකුව 2011). එපමණක් නොව පාරිභෝගිකයාගේ ප්‍රධාන ආහාර භෝගය සහ නිෂ්පාදකයාගේ හෝ අතරමැදිකරුගේ ප්‍රධාන ඉපයීම් මාර්ගය ලෙස ද සේවා නියුක්තිය ඇතිකරන රැකියා මූලාශ්‍රයක් ලෙස ද සහල් නිෂ්පාදන අංශය වැදගත් වේ. ලොකුපතිරගේ (2012) පර්යේෂණයට

අනුව මුළු ශ්‍රම බලකායෙන් සියයට 30කට වඩා වැඩි ප්‍රමාණයක් සෘජුවම හෝ වක්‍රවම සහල් හා වී නිෂ්පාදන අංශය හා සම්බන්ධ වේ. එමෙන්ම ශ්‍රී ලාංකිකයන් මිලියන 1.8කට වැඩි ප්‍රමාණයක් තම ජීවන උපාය වශයෙන් මෙම අංශයේ නියලෙන බව හඳුනාගනී.

දේශීය සන්දර්භය තුළ ද සහල් මිල නිරන්තරයෙන් උච්ඡාවචනය වන ස්වභාවයක් හඳුනාගත හැකි වේ. කාලගුණික හා දේශගුණික වෙනස්වීම්වලට අනුව සහ අස්වනු නෙළන වාරයන්හි විවිධත්වය අනුව සිදුවන අපේක්ෂිත විචලනයන් මෙන්ම අනපේක්ෂිත මිල කම්පනයන් ද ඒ අතර විය හැකියි. ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවන්ට අනුව 2008 වර්ෂයේදී අසාමාන්‍ය ලෙස ඉහළ ගිය වාර්ෂික සාමාන්‍ය සහල් මිල 2011 වසර වනවිට ක්‍රමයෙන් පහළ බැස තිබෙන අතර ප්‍රතිපත්තිමය වෙනස්කම් හා වෙළඳපොළ තත්වයන්ට ප්‍රතිචාර දක්වමින් 2012-2016 කාලය තුළ සහල් මිල ක්‍රමයෙන් ඉහළ යාමක් දක්නට ලැබුණි. සහල් මිල අර්බුදය ප්‍රබල වීමක් 2017 වසර ආරම්භයේදී හඳුනා ගැනීමට හැකිවුණි. 2016 වර්ෂයේ නොවැම්බර් මාසය වනවිට රුපියල් 86.20ක පැවති නාඩු සහල් කිලෝග්‍රෑමයක මිල 2017 වර්ෂයේ ජනවාරි මාසය වනවිට 96.26ක් ලෙස ඉහළ යාමෙන් එය තහවුරු වේ (ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේනතුව 2017). මෙය රටතුළ සහල් හිඟයක් නිර්මාණය කිරීමට පවා හේතු විය.

මෙලෙස නිරන්තරයෙන් සහල් මිල උච්ඡාවචනය වීම දේශීය ආර්ථික කාරකයන් කෙරෙහි නොයෙක් අයුරින් බලපෑම් කරයි. මිල ඉහළයාම පාරිභෝගික ක්‍රයශක්තිය, ජීවන තත්වය හා දරිද්‍රතාවය මත මෙන්ම කාර්මික නිෂ්පාදන අංශයේ වැටුප් පිරිවැය හා නිෂ්පාදන ඵලදායිතාවය කෙරෙහිද බලපෑම් ඇතිකළ හැකියි. එමෙන්ම ඉතුරුම් හා ආයෝජන කෙරෙහිද බලපෑම් ඇතිකළ හැකියි. ඉහළ සහල් මිල ග්‍රාමීය ප්‍රදේශවල අඩු අධ්‍යාපනලාභී ශ්‍රමිකයන් උත්තේජනය කරයි. එය දීර්ඝකාලීනව ග්‍රාමීය අංශයේ ශ්‍රමික වැටුප් ඉහළ යාමට හේතුවිය හැකියි. ඒ තුළින් වැටුප් ශ්‍රමික කුටුම්බ සහ ස්වයං රැකියාවල නියුතු ගොවීන් ප්‍රතිලාභ ලබති. සහල් මිල නිරන්තරයෙන් ඉහළයාම ආහාර මිල උද්ධමනයකට ද මගපාදයි. එය පොදු මිල මට්ටම ඉහළගොස් උද්ධමනකාරී තත්වයන් පවා ඇතිවීමට හේතුවිය හැකි අතරම ඒ හේතුවෙන් පසුකාලීනව සේවා වියුක්තිය වැනි සාර්ව ආර්ථික අස්ථායිතාවයන් ඇතිකිරීමට පවා හේතුවිය හැකියි. ඉහළ සහල් මිල ජාත්‍යන්තර ආර්ථික තරඟකාරිත්වය සීමා කිරීමට හේතුවිය හැකි අතරම ආහාර මිල අනපේක්ෂිත සහ අවිනිශ්චිත ලෙස උච්ඡාවචනය වන තරමට රටක දේශපාලනික ස්ථාවරත්වය ද අනපේක්ෂිත වේ.

එමෙන්ම සහල් නිෂ්පාදකයාගේ ආදායම තීරණය කරන ප්‍රධාන සාධකය ලෙස ද වැදගත්වන "ශ්‍රී ලංකාවේ දේශීය සහල් මිල" තීරණය වීම කෙරෙහි බලපාන සාධක විමර්ශනය කිරීම කාලීන වශයෙන් වැදගත්කමක් උසුලයි.

එමෙන්ම සහල් මිල තීරණය වීමට බලපාන සාධක සහල් මිල සමඟ පවත්නා කෙටිකාලීන හා දිගුකාලීන සබඳතාව සංඛ්‍යාත්මකව විශ්ලේෂණය කිරීම සහ මෙම සාධක අතුරින් බලාත්මක සාධක හඳුනාගැනීම මේ තුළින් අධ්‍යනය කිරීමට අපේක්ෂා කරයි.

**සාහිත්‍ය විමර්ශනය**

ලොව විවිධ පර්යේෂකයන් විසින් සහල් මිල හා සම්බන්ධිත නොයෙක් මාතෘකා ඔස්සේ විවිධ අයුරින් අධ්‍යනයන් සිදුකර ඇත. දයාරත්න ඇතුළු පිරිස (Dayarathne et al. 2008) විසින් ශ්‍රී ලංකාවේ සහල් මිල පාලනයේ අර්ථ හා නිරර්ථ පිළිබඳ අධ්‍යනය කිරීම සඳහා ද්විතියික දත්ත මූලාශ්‍ර භාවිතයෙන් දත්ත රැස්කර තිබේ. එහිදී සහල් මිල ඉහළයාම හා රජයේ ප්‍රතිපත්ති භාවිතය පිළිබඳව සාකච්ඡා කරයි. නොමඟ යවන ආනයනික ප්‍රතිපත්ති සහ තරඟකාරී නොවන සහල් වෙළඳපොළ ක්‍රියාකාරකම් ඉහළයන සහල් මිල කෙරෙහි මූලිකවම බලපාන බව හඳුනාගෙන තිබෙන අතර මිල සීමාවන් පැනවීම මඟින් ශ්‍රී ලංකාවේ සහල් මිල අර්බුදය ඵලදායිව විසඳිය නොහැකි බව පෙන්වා දී තිබේ. සහල් හා තිරිඟු ආනයනය කිරීම මිල සීමාවන් පැනවීමට සාපේක්ෂව කෙටිකාලීනව තාවකාලික සහල් හිඟය ඉවත් කළහැකි ක්‍රමයක් වන බව පෙන්වා දෙයි. එසේම කුමාර් සහ ශර්මා (Kumar & Sharma 2006) යන අය විසින් මිල විචලතාවය හා එහි නිර්ණායක අධ්‍යනය කිරීම උදෙසා 1980 - 2000 කාලවකවානුවේ ඉන්දියාවේ තිරිඟු, සහල් සහ රළු ධාන්‍යවල මිලගණන් පිළිබඳ කාලශ්‍රේණි දත්ත ලබාගනිමින්, සංඛ්‍යානමය විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ සිදුකරන ලද අධ්‍යනයට අනුව රජයේ මැදිහත්වීම් හා අනපේක්ෂිත සැපයුම සහල් සහ තිරිඟුවල මිල ඉහළයාම කෙරෙහි සෘණ බලපෑමක් ඇතිකරන බව හඳුනාගෙන ඇත. එමෙන්ම තිරිඟු හා සසඳන කල රජය විසින් සහල් මිලදී ගැනීම හා මිල සීමාවන් පැනවීම සඳහා මැදිහත්වීම තොග මිල පරාසය සඳහා වැඩි බලපෑමක් එල්ලකරන ආකාරය පෙන්වා දෙයි. ඒ අනුව මෙම අධ්‍යන දෙක තුළින්ම සහල් මිල පාලනය කෙරෙහි රාජ්‍ය මැදිහත්වීමෙහි සෘණ බලපෑම් පිළිබඳව සාකච්ඡා කර තිබේ.

සුෂිල් ඇතුළු පිරිස (Sushil et al. 2008) විසින් ද්විතීයික මූලාශ්‍ර ඔස්සේ රැස්කරන ලද දත්ත භාවිතකර සහල් මිල අර්බුදයේ හේතු, බලපෑම් සහ විසඳුම් පිළිබඳව අධ්‍යනයට ලක්කර ඇත. එහිදී ඔවුන් විසින් විස්තරාත්මක ක්‍රමවේදය භාවිත කරමින් දත්ත විශ්ලේෂණය කිරීම තුළින් සහල් සඳහා පවතින දීර්ඝකාලීන ඉල්ලුම් සැපයුම් අසමබරතාවය වර්තමාන සහල් අර්බුදයට බලපාන මූලිකම හේතුව බව පෙන්වා දෙයි. තවදුරටත් සහල් ඵලදා වර්ධන අනුපාතිකය, සහල් තොග මට්ටම, සහල් ඉල්ලුම, කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධනය සඳහා වන රාජ්‍ය ආයෝජන සහ තෙල් මිල ඉහළයාමත් සමඟ සහල් නිෂ්පාදනයේ ශක්ති පිරිවැය ආදී සාධක සහල් මිල

කෙරෙහි මූලිකවම බලපෑම් ඇතිකරන බව හඳුනා ගනියි. එමෙන්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතු ඉහළ නැංවීම තුළින් සහල් ඵලදායිතාවය ඉහළ නැංවීම සහල් මිල අර්බුදයට මූලික විසඳුමක් බව දක්වන අතරම ආහාර මිල ඉහළයාම අඩුමතරමින් මිලියන 32ක් පමණ මිනිසුන් නැවත දරිද්‍රතාවය දෙසට ඇදමීමට සමත්වන බව ද හඳුනාගෙන තිබේ.

ඇමරිකාවේ සහල් ඉල්ලුම, සැපයුම හා සහල් මිල තීරණය වීමට බලපාන සාධක පිළිබඳ විශ්ලේෂණය කිරීම පිළිබඳ අවධානය යොමු කරමින් ග්‍රාන්ට් සහ ලීත් (Grant & Leath, 1979) විසින් සිදුකළ අධ්‍යනය සඳහා අඩුතම වර්ග නිමානිත ක්‍රමය භාවිතයෙන් දත්ත විශ්ලේෂණයක් සිදුකර තිබේ. අධ්‍යනයට අනුව, වාර්ෂික දේශගුණික වෙනස්වීම්, තාක්ෂණික වෙනස්වීම්, සහල් වගාකරන භූමි ප්‍රදේශය, පසුගිය වර්ෂයේ ගොවිපළ මිල, රජයේ වැඩසටහන් ආදී සාධක සහල් සැපයුම කෙරෙහි දැඩිලෙස බලපාන අතර ම සහල්වල සිල්ලර මිල වෙනස්වීම සහල් ඉල්ලුම කෙරෙහි එතරම් බලපෑමක් නොමැති බව පෙන්වා දේ. එමෙන්ම වර්තමාන සහල් බීජ (බිත්තර වී) ඉල්ලුම ඊළඟ වසරේ වී වගාකරන අක්කර ප්‍රමාණය කෙරෙහි විශාල බලපෑමක් ඇතිකරන බව ද හඳුනා ගනී.

සච්චමර්ගා සහ විලියම්ස් (Sachchamarga & Williams, 2004) විසින් ද්විතීයික දත්ත මූලාශ්‍ර භාවිත කරමින් ආර්ථික මිථික විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ සහල් නිෂ්පාදනය සඳහා බලපාන ආර්ථික සාධක හඳුනාගැනීම හා මිනුම් කිරීම පිළිබඳව තායිලන්තය ඇසුරින් සිදුකළ අධ්‍යයනයට අනුව පෙර වර්ෂවල වී වගාකළ භූමි ප්‍රමාණය මෙම වර්ෂයේ වගාකරන භූමි ප්‍රමාණය කෙරෙහි බලපාන බව පෙන්වා දෙයි. එමෙන්ම වර්ෂාපතනයේ ප්‍රමාණය, වී හෝ සහල් මිල ගණන්, ආදේශන භාණ්ඩ මිල ගණන් හා යෙදවුම් මිල ගණන් ආදී සාධක සහල් නිෂ්පාදනය සඳහා මූලිකවම බලපාන බව හඳුනා ගනියි.

**පර්යේෂණ පරතරය**

සහල් මිල ප්‍රතිපත්ති සහ ඒවායේ සමාජ ආර්ථික ප්‍රතිවිපාක, එමෙන්ම සහල් මිල උච්චාවචනය වීම හා එය ආර්ථික, සමාජ හා දේශපාලනික අංශයන් වෙත ඇතිකරන බලපෑම, සහල් ඉල්ලුම හා සැපයුම තීරණය කරන සාධක යනාදී ක්ෂේත්‍රයන් පිළිබඳ දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද අධ්‍යනයන් රැසක් සිදුකර ඇති මුත් ඍජුවම සහල් මිල තීරණය වීමට බලපාන සාධක හඳුනාගැනීම සඳහා මෑතකාලීනව ශ්‍රී ලංකාව තුළ සිදුකර ඇති අධ්‍යනයන් සීමිත වේ. එබැවින් දේශීය සහල් මිල තීරණය වීමට බලපාන සාධක විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යනයේ පර්යේෂණ පරතරය වේ.

**අධ්‍යයන අරමුණු**

අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ දේශීය සහල් මිල තීරණය වීම කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීමයි. එහිදී පොදුවේ සහල් ඉල්ලුම හා සැපයුම වෙනස්වීම ඔස්සේ සහල් මිල වෙනස්වීම සඳහා බලපාන සාධක මොනවා ද යන්න හඳුනාගැනීම සිදුකෙරේ. සහල් මිල තීරක (Factors) සහල් මිල සමඟ පවත්නා කෙටිකාලීන හා දිගුකාලීන සබඳතාව සංඛ්‍යාත්මකව විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යනයේ උප අරමුණක් ලෙස ගැනේ. එමෙන්ම හඳුනාගත් සහල් මිල තීරණය වීමට බලපාන සාධක අතුරින් බලාත්මක සාධක කවරේ ද යන්න පිළිබඳ විග්‍රහ කිරීමට ද මේ ඔස්සේ අපේක්ෂා කෙරේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යනය සඳහා විස්තරාත්මක විශ්ලේෂණය මෙන්ම ආර්ථිකමිතික විශ්ලේෂණ ක්‍රමවේදය ද යොදා ගනියි. සහල් මිල තීරණය වීමට බලපාන සාධක සහල් මිල සමඟ පවත්නා සබඳතාවයේ ස්වරූපය අධ්‍යනය කිරීම සඳහා ආර්ථිකමිතික විශ්ලේෂණ ක්‍රමවේදය යොදාගනු ලැබේ. එහිදී කාලශ්‍රේණි ප්‍රතිපායන ආදර්ශයක් භාවිත කරමින් එම සාධක සහල් මිල සමඟ පවත්නා කෙටිකාලීන හා දිගුකාලීන සබඳතාවය පරීක්ෂා කරයි. ඒ සඳහා පහත ප්‍රතිපායන ආදර්ශය යොදා ගනියි.

$$\boldsymbol{ln}(\boldsymbol{RP_t}) = \boldsymbol{\beta_o} + \boldsymbol{\beta_1}\ln(\boldsymbol{GP_t}) + \boldsymbol{\beta_2}\ln(\boldsymbol{pp_t}) + \boldsymbol{\beta_3}\ln(\boldsymbol{pw_t}) + \boldsymbol{\beta_4}\ln(\boldsymbol{iR_t}) + \boldsymbol{\beta_5}\ln(\boldsymbol{EP_t}) + \boldsymbol{\beta_6}\ln(\boldsymbol{AP_t}) + \boldsymbol{\beta_7}\ln(\boldsymbol{RA_t}) + \boldsymbol{\varepsilon_t}$$

$R$ = ශ්‍රී ලංකාවේ දේශීය සහල් මිල (සහල් කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල)

$G$ = වී කිලෝග්‍රෑමයකට පනවා ඇති සහතික මිල

$P$ = වාර්ෂික වී නිෂ්පාදන ප්‍රමාණය

$Pw$ = තිරිඟු පිටි කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල

iR = වාර්ෂික සහල් ආනයනික ප්‍රමාණය

$E$ = වාර්ෂික සාමාන්‍ය විදුලි ගාස්තුව

$A$ = මධ්‍ය වාර්ෂික ජනගහනය

$RA$ = වාර්ෂික වර්ෂාපතනය (mm)

$\varepsilon_t$ = දෝෂ පදය

$t$ = කාල උපනතිය (1977 - 2016)

මෙහිදී සහල් කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල සඳහා නාඩු සහල් කිලෝග්‍රෑමයක වාර්ෂික සාමාන්‍ය මිල යොදා ගැනේ. මෙහි ඇති වී කිලෝග්‍රෑමයකට පනවා ඇති සහතික මිල නැමැති ස්වායත්ත විචල්‍යය මඟින්

වී මිල තීරණය කිරීම සඳහා වන රාජ්‍ය මැදිහත්වීම නිරූපණය කරයි. වාර්ෂික වී නිෂ්පාදන ප්‍රමාණය තුළින් දේශීය සහල් සැපයුම තීරණය වන අතර තිරිඟුපිටි මිල තුළින් සහල් මිල කෙරෙහි ආදේශන භාණ්ඩ මඟින් ඇතිකරන බලපෑම නිරූපණය කරයි. එමෙන්ම සහල් ආනයනික ප්‍රමාණය රටේ සමස්ත සහල් සැපයුම කෙරෙහි බලපාන විචල්‍යකි. වාර්ෂික සාමාන්‍ය විදුලි ගාස්තුව ඇසුරින් සහල් නිෂ්පාදනයේ බලශක්ති පිරිවැය නිරූපණය කරයි. මධ්‍ය වාර්ෂික ජනගහනය සහල් ඉල්ලුම කෙරෙහි බලපෑම් කරන අතර වාර්ෂික වර්ෂාපතනය සහල් නිෂ්පාදනය කෙරෙහි බලපාන විචල්‍යකි.

දත්ත විශ්ලේෂණය කිරීම සඳහා E-views 7 පරිගණක මෘදුකාංගය භාවිත කෙරේ. ද්විතීයික දත්ත මත පදනම් වන මෙම අධ්‍යනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු වාර්තා, පර්යේෂණ ලිපි, ප්‍රකාශිත පොත්පත්, සඟරා සහ අන්තර්ජාලය යනාදියෙන් දත්ත රැස්කිරීමට අපේක්ෂා කෙරේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

Bhandari, H. , Pandey, S. , Rosegrant, M. and Sulser, T. 2008. Rice Price Crisis: Causes, Impact And Solutions. *Asian Journal of Agriculture And Development.* 7(2).

Dayarathne, O.G., Jayawickrama, J.M.A. and Ranathilaka, M.B. . 2008.. Sense and Nonsence of Rice Price Controls In Sri Lanka. *The peradeniya journal of economics*. 2(1-2): 60-85.

Grant, R. Warren. and Leath, N. Mack. 1979. Factors affecting supply, demand and prices of U.S. Rice. No. 3.

Kumar, Parmod. and Sharma, Anil. 2006. Price Variability and its Determinants. *Indian economic review.* 41(2): 149-172.